## ලුණුගල ප්‍රාදේශීය සභාව 2022.03.22 වන දින පැවති
## මාසික මහ සභා රැස්වීම් වාතර්ාව

2022 මාතර්ු මස මාසික මහ සභා රැස්වීම 2022.03.22 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්වයෙන් සභා රැස්වීම් කටයුතු ආරම්භ කරන ලදී.

**මෙදින පැමිණීම,**

1. ගරු සභාපති — චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා
2. ගරු උප සභාපති — ධම්මලිංගම් සෙල්වරාණී මැතිනිය
3. ගරු මන්ත්‍රී — මොහොම්මදු ජෙමීල් මෙහොම්මදු ජරෝ මැතිතුමා
4. ගරු මන්ත්‍රී — පෙරියසාමි ලෝගනාදන් මැතිතුමා
5. ගරු මන්ත්‍රී — පලනියන්ඩි සුබ්‍රමනියම් මැතිතුමා
6. ගරු මන්ත්‍රී — ශ්‍රී හස්ත ලේකම්ලාගේ චන්දන සමන් කුමාර මැතිතුමා
7. ගරු මන්ත්‍රී — සුමනාවති මැතිනිය
8. ගරු මන්ත්‍රී — ජෙයකුමාර් පරමසිවම් මැතිතුමා
9. ගරු මන්ත්‍රී — දිසානායක මුදියන්සේලාගේ අසංක විජේබංඩාර මැතිතුමා
10. ගරු මන්ත්‍රී — පතිරණගේ කුමාරසිරි සමරවීර මැතිතුමා
11. ගරු මන්ත්‍රී — රාමන් ජේයශංකර් මැතිතුමා
12. ගරු මන්ත්‍රී — මුරුගයියා ගනේෂමූතරී මැතිතුමා
13. ගරු මන්ත්‍රී — රෙන්ගසාමි කනගසුන්දරි මැතිනිය
14. ගරු මන්ත්‍රී — රත්නායක මුදියන්සේලාගේ සිරියාවති මැතිනිය
15. ගරු මන්ත්‍රී — දිසානායක මුදියන්සේලාගේ තිලකසිරි දිසානායක මැතිතුමා
16. ගරු මන්ත්‍රී — මාපා බණ්ඩාරලාගේ සමන් කුමාර මැතිතුමා
17. ගරු මන්ත්‍රී — රාජේන්ද්‍රන් මහාදේවි මැතිනිය
18. ගරු මන්ත්‍රී — වික්‍රමසිංහ ආරච්චි පතිරණලාගේ අනුර වික්‍රමතුංග මැතිතුමා
19. ගරු මන්ත්‍රී — රාජපක්ෂ වත්තේ විදානේලාගේ ඇඩ්වින් මැතිතුමා
20. ගරු මන්ත්‍රී — අබේකෝන් මුදියන්සේලාගේ ජයවීර අබේකෝන් මැතිතුමා

**න්‍යාය පත්‍රයට අනුව සභාවේ වැඩ කටයුතු ආරම්භ විය.**

**01. පසුගිය සභා වාතර්ාව සභා සම්මත කර ගැනීම (2022.02.22 වන දින)**

**01/1. සංශෝධන**

**ගරු මන්ත්‍රී ඩී.එම්.අසංක විජේබණ්ඩාර මැතිතුමා.**

පසුගිය සභා වාතර්ාවෙහි මඩොල්සිම පුස්තකාල ගොඩනැගිල්ල ඉදි කිරිම සම්බන්ධව බෙදීමක් ඉල්ලා සිටි අතර එම යෝජනාවෙහි පවතින අබර්ුද හේතුවෙන් ගරු මන්ත්‍රිවරු තිදෙනෙකු,
එනම්, ගරු මන්ත්‍රි ආර්.ඩබ්.ඩබ්.ඇඩ්වින් මැතිතුමා
ගරු මන්ත්‍රි එම්.බි.සමන් කුමාර මැතිතුමා
ගරු මන්ත්‍රි ඩි.එම්.අසංක විජේබණ්ඩාර මැතිතුමා
ඊට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරනු ලැබු බවත් ඒ පිළිබදව වාතර්ාවේ සදහන් වී නොමැති බැවින් එය සංශෝධනය විය යුතු බව පැවසීය.

**<u>ගරු මන්ත්‍රි පි.සුබ්‍රමනියම් මැතිතුමා.</u>**

පසුගිය සභා වාතර්ාවෙහි ෂෝලන්ඩ්ස් උඩ කොටස හද්‍රකාලි අම්මන් දේවාලය සම්බන්ධ යෝජනාව ගරු මන්ත්‍රි පී.කුමාරසිරි සමරවීර මැතිතුමාගේ නමින් සදහන් වී තිබෙන අතර එය සංශෝධනය විය යුතු බව පැවසීය.

**<u>ගරු මන්ත්‍රි එම්.බී.සමන් කුමාර මැතිතුමා.</u>**

පසුගිය සභා වාතර්ාවෙහි 04 වන පිටුවෙහි සේවකයින් බඳවා ගැනීමට රජය තීරණය කොට තිබෙන බව සදහන් වී ඇති අතර එය සේවකයින් බඳවා නොගැනීමට රජය තීරණය කොට ඇත ලෙසින් සංශෝධනය විය යුතු බව පැවසීය.

එසේම මඩොල්සිම සම්බන්ධව මා විසින් අදහස් දැක්වූ බවට සදහන් කර තිබෙන අතර එයද සංශෝධනය විය යුතු බව පැවසීය.

**<u>ගරු මන්ත්‍රි ඩි.එම්.තිලකසිරි දිසානායක මැතිතුමා</u>**

පසුගිය සභා වාතර්ාවෙහි සදහන් පරිදි වතර්මාන සේවක මණ්ඩලය ද කළමනාකරණය කර ගනිමින් සතොස ආයතනයට සේවකයින් බඳවා ගන්නා බව සදහන් කොට ඇති අතර එය සතොස ආයතනයට නොව පුස්තකාලයට සේවකයින් බඳවා ගැනිම යනුවෙන් සංශෝධනය විය යුතු බව පැවසීය.

**<u>ගරු මන්ත්‍රි පි.කුමාරසිරි සමරවීර මැතිතුමා</u>**

1. පසුගිය සභා වාතර්ාවේ 14 වන පිටුවේ පරිදි වරාය සංවධර්න අධිකාරි සභාපති ලෙස පත් වූ සුසන්ත ජයමාන්න මහතාගේ නම ප්‍රසන්ත ජයමාන්න ලෙස වෙනස් විය යුතුය. එසේම එහි ජනතාව ලෙස සදහන් ස්ථානය ජනතා ලෙස සංශෝධනය විය යුතුය.

2. එසේම 15 වන පිටුවේ සදහන් පරිදි සේවකයින් යොදවා මඩ සහිත පස් දැමීමට ප්‍රාදේශිය සභාව කටයුතු කිරිම ලෙස සංශෝධනය විය යුතුය.

3. මුදල් කමිටු වාතර්ාවේ ටයර් මිලදි ගැනීම නොව ටයර් ඩැක් කර වියදම අඩු කර ගැනීමට පළාත් පාලන කොමසාරිස්තුමා අනුමැතිය ලබා දුන්නා ලෙස සංශෝධනය විය යුතුය.

4. 15 පිටුවේ නගරයේ යම් ස්ථානයක නොව නගරයේ ගරු මන්ත්‍රි එම්.ජේ.එම්.ජරුක් මැතිතුමාගේ නිවස අසල යනුවෙන් සංශෝධනය විය යුතුය.

5. බැකෝ ලෝඩර් යන්ත්‍රයේ පැය ගණන දක්වා ඇත්තේ මාසිකව නොව වාෂර්ිකව ලෙස සංශෝධනය විය යුතුය.

**2022.02.22 වන දින පැවති මහ සභා රැස්වීම් වාතර්ාව ඉහත සංශෝධන වලට යටත්ව සත්‍ය වාතර්ාවක් බව සභා සම්මත විය යුතු බවට ගරු මන්ත්‍රී පී.ලෝගනාදන් මැතිතුමා විසින් යෝජනා කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රි ඩි.එම්.අසංක විජේබණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව පසුගිය සභා වාතර්ාව ඒකමතිකව සම්මත විය.**

**<u>02. ගරු සභාපතිතුමාගේ නිවේදන :-</u>**

**02/1.** මැතිවරණ කොමසාරිස් ජනරාල් විසින් එවන ලද පළාත් පාලන ඡන්ද විමසීම් ආඥා පනතේ 66(ආ) වගන්තිය අනුව කටයුතු කිරීමට මෙයින් නිවේදනය කරමි.

**02/2.** නව සභා ලේකම්තුමියගේ රාජකාරි පැවරීම සදහා ගරු සභාවේ අනුමැතිය ලබා ගැනිම

**03. සංදේශ/ පෙත්සම්/ පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරීම**

**03/1.** පස්සර,ශාන්ත බානබාස් ක්‍රිස්තියානි පල්ලියේ ප්‍රධාන පූජකතුමා විසින් යොමු කරන ලද "පස් තුනි කොට මාගර්ය සකස් කර ගැනිම සම්බන්ධව" යන ලිපිය ගරු මන්ත්‍රි ආර්.ජෙයශංකර් මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

**03/2.** සමනළ පෙර පාසල් ආචාර්යා එච්.එම්.හේමාවතී මහත්මිය විසින් යොමු කරන ලද "පෙර පාසලට විදුලිය ලබා ගැනිම සම්බන්ධව" යන ලිපිය ගරු මන්ත්‍රි ඒ.එම්.ජයවීර අබේකෝන් මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

**03/3.** නිදහස් වෙළද කලාප හා පොදු සේවා සේවක සංගමයේ සම ලේකම්තුමා විසින් අතිගරු ජනාධිපති තුමා වෙත යොමු කර ඇති "අඩු ආදායම්ලාභි ජනතාවට අත්‍යාවශ්‍ය භාණ්ඩ 2020 ජනවාරි මිලට ලබා දෙන ලෙස ඉල්ලීම සම්බන්ධව" යන ලිපිය ගරු මන්ත්‍රි පී.කුමාරසිරි සමරවීර මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

**03/4.** "නව වෙළද සංකීණර්යේ කඩ කුලි අය කිරිම සම්බන්ධව" යන ලිපිය ගරු උප සභාපති ඩී.එම්.සෙල්වරාණි මැතිණිය විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

**03/5.** ලුණුගල, රියදුරු සුභසාධක සංගමය විසින් යොමු කරන ලද " කුලි රථ ගාල් කරන ස්ථානයේ තාප්පය ඉවත් කර ගැනිම සම්බන්ධව" යන ලිපිය ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

**03/6.** ලුණුගල, ආයුවෙර්ද රෝහලේ කායර්භාර වෛද්‍ය නිළධාරි විසින් යොමු කරන ලද " ජල ගැටළුව සම්බන්ධවයි" යන ලිපිය ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

**04. කල් දී ඇති ප්‍රශ්ණ :-**

**04/1. ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා**

**04/1/1.** 2022 වැය සාරාංශය PS 14 හි ණය හිමියෝ වශයෙන් පෙන්වා ඇති රු.4788594.85 මුදල විස්තරාත්මක පෙන්වා දෙන ලෙස දැන්වීය. (පුද්ගලික ලිඛිතව)

**පිළිතුර**

**ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

ඊට අදාළ පිළිතුරු පුද්ගලිකව ලබා දෙන ලදි.

**04/1. ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා**

**04/1/2.** ලුණුගල ප්‍රාදේශිය සභා සේවක මහත්ම මහත්මීන්ගේ පෙබරවාරි මස කල වැඩ පිළිබඳව සවිස්තරාත්මක වාතර්ාවක් ලබා දෙන ලෙස දැන්වීය. බහුකායර්, අනියම්, අදේශක, කොන්ත්‍රාත් ඇතුලු සියලුම වැටුප්, දීමනා ලබන අය. අප්‍රේල් මස ඉදිරි වැඩසටහන 2022 අප්‍රේල් 03 වන දින පුද්ගලිකව ලබාදෙන්න.

**පිළිතුර**

**ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

ඊට අදාළ පිළිතුරු පුද්ගලිකව ලබා දෙන ලදි.

**04/1. ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා**

**04/1/3.** ලුණුගල ප්‍රාදේශිය සභාව භුක්තියේ තිබෙන පහත සඳහන් දේපල රැක ගැනීමට ගත් ක්‍රියාමාගර් ලිඛිතව පෙන්වා දෙන්න.

1. මඩොල්සිම රෝබේරිය පාර ඉඩම (වැසිකිළිය/කුණු බක්කිය අයත් ඉඩම)
2. කොකාගල පුංචි ලෝකාන්තය

**පිළිතුර**

**ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

මෙම ඉඩම අපි ඉල්ලා තිබෙනවා. ඒ සඳහා වෙනම ලිපිගොනුවක් තිබෙන නමුත් ඒ සඳහා **LRC** එකෙන් අවසාන අනුමැතිය ලැබී නොමැත. මම දෙවරක් ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට උත්සහ කල අතර 1999 වෂර්යේ ගැසට් පතකින් ඉඩම පිළිබඳ බලය පවරා ඇත්තේ ප්‍රාදේශිය ලේකම් වෙතය.එතුමාට අවශ්‍ය නම් **LRC** එකට හෝ ප්‍රාදේශිය සභාවට ඉඩම් පැවරිය හැකිය. මෙම ඉඩම සම්බන්ධයෙන් ප්‍රාදේශිය ලේකම්තුමා ගැටළුව විසඳන ලෙස ඉල්ලීමක් කරමු. එමෙන්ම ඒ පිළිබඳව කඩිනමින් ඉදිරි කටයුතු සිදු කරන ලෙස සභා ලේකම්තුමිය දැනුවත් කරන ලදි.

**04/1. ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා**

**04/1/4.** 2022.02.22 මහා සභාවට ඉදිරිපත් කල මාගේ ප්‍රශ්න 04/1/2 පිළිතුරු ලබාදුන්නේ නැත. එයට පිළිතුරු ලබාදෙන ලෙස දැනුම් දෙන ලදි.

**පිළිතුර**

**ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

ඊට අදාළ පිළිතුරු කඩිනමින් ලිඛිතව ලබා දෙන්නම්.

**05. කල් දී ඇති යෝජනා :-**

**05/1. ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමාගේ යෝජනා :-**

**05/1/1.** මඩොල්සිම කරදිය මිරිදිය මාළු වෙළඳසැල හා ලුණුගල බස්නැවතුම්පල උඩු මහලේ අංක 05 කඩ නැවත ටෙන්ඩර් කිරීමට 2022.03.08 දින මුදල් කමිටුවේදී තීරණය කරන ලදී. ඒ සඳහා අවම ලංසු මුදල තීරණය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා**

ලුණුගල බස්නැවතුම්පල උඩු මහලේ අංක 05 කඩකාමරය අවම ලංසුව ලක්ෂ 05 ක් ලෙස තීරණය කිරිම සුදුසුය.

ඒ අනුව, මඩොල්සිම කරදිය මිරිදිය මාළු වෙළඳසැල 2022 වෂර්යේ පැවති ආරම්භක ටෙන්ඩර් මුදලේ වටිනාකමට අනුව අවම ලංසුව තීරණය කිරීමටත්, ලුණුගල බස්නැවතුම්පල උඩු මහලේ අංක 05 කඩකාමරය අවම ලංසුව ලක්ෂ 05 කට ටෙන්ඩර් කිරීමටත් සභාවේ ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1. ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමාගේ යෝජනා :-**

**05/1/2.** 2021 මිරිදිය හා කරදිය මාළු වෙළඳසැල ඒ.එම්.විජේසිරි මහතා විසින් බදුගන්නා ලද අතර, ඔහුගේ හදිසි අභාවය හේතුවෙන් හිඟ ටෙන්ඩර් කඩකුලී අයකරගැනීමට නොහැකි විය. එසේම 2021.05.13 වන දින සිට මාස 04 ක කාලයක් කොවිඩ් 19 සංචරණ සීමාව පැනවූ බැවින්, ව්‍යාපාර කටයුතු අඩපණ වූ බැවින්, එම වෙළඳසැල පවත්වාගෙන යාමට අපහසු විය. හිඟ මුදල් ගෙවීමට සහන කාලයක් ලබාදනෙ ලෙස ඉල්ලීමක් කර ඇති අතර, මේ වනවිට මියගිය බදුකරුගේ පසුගිය වෂර්යේ හිඟ ටෙන්ඩර් කඩකුලී මුදල් කපා හැරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී පි.ලෝගනාදන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/3.** ලුණුගල පොදු වෙළඳපල කඩකාමරය බදුගෙන ඇති ඩී.එම්.නන්නදාවති මිය විසින් කඩකුලී නොගෙවීම හේතුවෙන් 2018.01.10 වන දින බදුල්ල දිසා අධිකරණයේ සභාව විසින් පවරා තිබූ නඩුව 2021.11.03 වන දින නිශ්ප්‍රභා වූ අතර, නැවත 2022 වෂර්යේ ඇපැලක් බදුල්ල දිසා අධිකරණයේ ගොනු කර ඇත. ඉදිරි අවශ්‍ය කටයුතු සඳහා යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්.තිලකසිරි දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/4.** අල් අක්ෂා පෙරපාසලේ විවිධ ප්‍රසංගය සඳහා ළමුන් 33 දෙදෙනෙකුට ත්‍යාග ලබාදෙන ලෙස ඉල්ලීමක් කර ඇත. එම ත්‍යාග ලබාදීමට අවශ්‍ය අනුමැතිය ලබාගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/5.** ප්‍රජා ජල සම්පාදන වැඩ සටහන (PSDG) - 2021 යටතේ සිදුකරන ලද මඩොල්සීම පානීය ජල ව්‍යාපෘතිය වැඩිදියුණු කිරීමේ කමර්ාන්තයේ පළමු හා අවසාන ගෙවීම වන රු.648263.69 ක මුදල ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලය වෙත ගෙවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ආර්.ජෙයශංකර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/6.** පරිසර හිතකාමී කෘෂි කමර්ාන්තය සඳහා කාබනික පොහොර නිෂ්පාදනයට අවශ්‍ය පහසුකම් ලබාගැනීම යටතේ, සූරියගොඩ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ කොම්පෝස්ට් ගබඩාව සඳහා නිමි වැඩ වටිනාකම රු.1977164.07 කි. එම මුදලින් 20% කොටස් මුදලක් පුබුදු ග්‍රාම සංවර්ධන සමිතිය වෙත සභා අරමුදලින් ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/7.** ප්‍රාදේශීය සභාව සතු වාහන පරීක්ෂා කිරීම වෙනුවෙන් රු.10073.50 ක මුදලක් පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ, කහගොල්ල යන ආයතනය වෙත ගෙවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/8.** UP PC 0370 අංක දරණ කැබ් රථයේ බ්රේක් ලයිනර් දැමීම සඳහා බදුල්ල ලක්ෂිත මෝටසර් ආයතනය වෙත රු.32300.00 ක මුදලක් ගෙවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී පී.ලෝගනාදන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/9.** ZA 5016 බැකෝ යන්ත්‍රයේ පිටුපස බූම් කඳ අලුත්වැඩියා කිරීම වෙනුවෙන් බිබිල කමල් මෝටසර් ආයතන වෙත රු.39000.00 මුදලක් ගෙවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/10.** 2022 පෙබරවාරි මාසය සඳහා ප්‍රාදේශීය සභාව සතු වාහන රාජකාරියේ යෙදවීම වෙනුවෙන් ලබාදුන් ඉන්ධන සඳහා රු.150416.00 මුදලක් ලුණුගල ඉන්ධන පිරවුම් හලේ ආර්.එම්.නිමල් සෙනවිරත්න මහතා වෙත ගෙවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී එස්.එච්.එල්.වන්දන සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/11.** වතර්මානයේ වෙළඳපල තුළ පවතින ඉන්ධන හිඟය හේතුවෙන් ලුණුගල ඉන්ධන පිරවුම්හලේ ඉන්ධන නොමැති වීම හේතුවෙන් රියදුරු ජී.ජී.අවන්ත රෝහණ මහතාගේ අත්පිට මුදලින් PF 7347 කැබ් රථයට ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් රු.7260.00 මුදලක් කැබ් රථයේ රියදුරු ජී.ජී.අවන්ත රෝහණ මහතා වෙත ගෙවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ආර්.ඩබ්.ඩබ්.ඇඩ්වින් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/12.** වතර්මානයේ වෙළඳපල තුළ පවතින ඉන්ධන හිඟය හේතුවෙන් ලුණුගල ඉන්ධන පිරවුම්හලේ ඉන්ධන නොමැති වීම හේතුවෙන් රියදුරු ජී.ජී.අවන්ත රෝහණ මහතාගේ අත්පිට මුදලින් PF 7347 කෘ රථයට ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් රු.9858.00 මුදලක් රියදුරු ජී.ජී.අවන්ත රෝහණ මහතා වෙත ගෙවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී පී.ලෝගනාදන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/13.** PF 7347 කෘ රථයට ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් රු.10560.00 මුදලක් මඩොල්සීම ඉන්ධන පිරවුම්හලේ ආර්.එම්.ඉන්ද්‍රාණි මිය වෙත ගෙවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/14.** තණකොළ කපන යන්ත්‍රය සඳහා ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් රු.2915.00 මුදලක් මඩොල්සිම ඉන්ධන පිරවුම්හලේ ආර්.එම්.ඉන්ද්‍රාණි මිය වෙත ගෙවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්.තිලකසිරි දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/15.** මඩොල්සිම කඩකාමර 08ක් ඉදිකිරීම් සඳහා තෝරාගන්නා ඉඩම නිරවුල් කර අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ජේ.පරමසිවම් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/16.** කොකාගල දෙමළ විද්‍යාලයේ අනාරක්ෂිත ලෙස පිහිටා ඇති ගස ඉවත් කර ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී පී.කුමාරසිරි දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/17.** ලුණුගල ප්‍රාදේශිය සභාවට බැකෝ ලෝඩර් යන්ත්‍රය සඳහා (මිලගණන් කැඳවා) කහ වර්ණයෙන් යුතු 16 කි.ග්‍රෑ ග්‍රීස් බකට් එකක් මිලදී ගැනීම වෙනුවෙන් ලුණුගල නව වෙළඳ සංකීර්ණයේ නුදාරා මෝටර්ස් වෙත රු.24510.00 ක මුදලක් ගෙවීමට අනුමැතිය ලබාගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී පී.ලෝගනාදන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/18.** ප්‍රාදේශිය සංවර්ධන සහයක ව්‍යාපෘතිය (LDSP) යටතේ 4 හා 5 වන වාරික වලට අදාළව ලුණුගල ප්‍රාදේශිය සභාව වෙත වාෂිකව රුපියල් මිලියන 16.67 ක මුදලක් අනුමත වී ඇති අතර, එම අරමුදල් මඟින් පහත සඳහන් ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරීමට යෝජනා කරමි.

1. ලුණුගල පොදු වෙළඳ සංකීර්ණයේ දෙවන මහල ඉදිකිරීම
2. පැරණි පොදු වෙළඳ සංකීර්ණය ඉවත් කර නව වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීම
3. ලුණුගල නගරය සඳහා ළමා උද්‍යානයක් ඉදිකිරීම.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ආර්.ඩබ්.ඩබ්.ඇඩ්වින් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/19.** මඩොල්සිම, බටවත්ත හි පදිංචි වි.ක්‍රිෂ්ණමුතරී මහතා විසින් රැකියාව අවස්ථාවක් ලබාදෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර, සභාවේ ක්ෂේත්‍ර කම්කරු තනතුරක් එම අයට ලබාදී දෛනික වැටුපක් ගෙවීමට අනුමැතිය ලබාගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ජේ.පරමසිවම් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/20.** අප ආයතනයේ සේවයේ නිරත වෙමින් සිට අසනීප තත්ත්වයෙන් පසුවී මිය ගිය අසිත් රත්නායක මහතාගේ බිරිඳ දෛනික වැටුප් මත අප ආයතනයේ සේවයට බඳවා ගැනීම වෙනුවෙන් අනුමැතිය ලබාගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/21.** ලුණුගල ප්‍රාදේශිය සභාවේ දෛනික පදනම මත සේවය කරන සේවකයින්ගේ පත්වීම් ලිපියෙහි සඳහන් කර ඇති දින 20 ක වැටුප් ගෙවීමේ කොන්දේසි වාක්‍ය සංශෝධනය කරවා ගැනීම වෙනුවෙන් අනුමැතිය ලබාගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/22.** හොප්ටන් අම්බලන්ගොට ඩිවිෂන් ශ්‍රී මුත්තුමාරිඅම්මන් කෝවිල ප්‍රතිසංස්කරණය කමර්ාන්තයේ 20% අත්තිකාරම් මුදලක් සිගරම් ග්‍රාම සංවධර්න සමිතිය ගෙවීමට අනුමැතිය ලබාගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී පී.සුබ්‍රමනියම් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/23.** අත්තනගොල්ල - පාස්රෝස් මාගර්ය සංවධර්නය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්.අසංක විජේබණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/24.** ලුණුගල ප්‍රාදේශිය ලේකම්තුමා විසින් යොමු කරන ලද ලිපියට අනුව ඌව පළාතේ සියලුම ප්‍රාදේශිය ලේකම්වරු ලුණුගල ප්‍රාදේශිය ලේකම් කායර්ාලය වෙත පැමිණෙන බැවින් එහි පවතින අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් (කායර්ාලය ඇතුලත පාට්ෂන් කිරීම) හැකිනම් යම් දායකත්වයක් ලබා දෙන ලෙස ඉල්ලීම් කොට ඇත. ඒ අනුව මාගේ ප්‍රතිපාදන මඟින් රු.ලක්ෂ 03 ක් ලබා දීමට අනුමැතිය ලබා ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්.තිලකසිරි දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී පී.ලෝගනාදන් මැතිතුමා.</u>**

මේ පිළිබඳව මා ද දැනුවත් කළ අතර ඒ වෙනුවෙන් මාගේ ප්‍රතිපාදන මඟින් යම් දායකත්වය ලබා දීමට මා එකඟ වෙමි.

**<u>ගරු මන්ත්‍රී පී.සුබ්‍රමනියම් මැතිතුමා.</u>**

සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ දායකත්වය මේ සඳහා ලබා දිම සුදුසුය.

**<u>ගරු මන්ත්‍රී එම්.බී.සමන් කුමාර මැතිතුමා.</u>**

එක් පුද්ගලයෙකුගේ දායකත්වයක් ලෙස නොසලකා සමස්ථ ලුණුගල ප්‍රාදේශිය සභාවෙහි සභික මණ්ඩලය නියෝජනය වන පරිදි එම මුදල් ප්‍රතිපාදන වෙන් කිරිම සුදුසු බවයි මගේ හැඟිම.

**<u>ගරු මන්ත්‍රී පී.සුබ්‍රමනියම් මැතිතුමා.</u>**

පොදුවේ සියලු දෙනා ප්‍රාදේශිය ලේකම් කායර්ාලයෙන් දෛනික රාජකාරි කටයුතු ඉටු කරවා ගන්නා බැවින් සියලුම ගරු මන්ත්‍රිවරුන්ගේ දායකත්වය ලබා ගැනිම සුදුසුය.

ඒ අනුව සභාවේ සියලු ගරු මන්ත්‍රිවරුන්ගේ දායකත්වය මත රු.ලක්ෂ 10 කට යටත්ව මුදල් ප්‍රතිපාදනයක් ලුණුගල ප්‍රාදේශිය ලේකම් කායර්ාලයේ අලුත්වැඩියා (කායර්ාපාට්ෂන් සඳහා ලබා දීම) සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**<u>05/2. ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමාගේ යෝජනා</u>**

**05/2/1.** 2021 මාතර්ු මස 21 වන දින පස්සර 19 කණුව ප්‍රදේශයේදී සිදුවූ මාරක බස් රථ අනතුර පිළිබඳව සාකච්ඡා කර මිය ගිය සහ තුවාල වු අයට සාධාරණය ඉටු කිරීමට මැදිහත් වීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ආර්.ඩබ්.ඩබ්.ඇඞ්වින් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/2/2.** ලුණුගල ප්‍රාදේශිය සභාවේ බහුකායර් ගොඩනැගිල්ල කුලියට උත්සව සඳහා ලබා දීමේදී බල ප්‍රදේශයේ අසරණ දුප්පත් අඩුආදායම් ලාභීන් සඳහා සහනයක් ලබාදීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/2/3.**ලුණුගල ප්‍රාදේශිය සභාවට තිබූ ආදායම් අහිමි වීම දැනට තිබෙන ආදායම් අය කර නොගැනීම අලුත් ආදායම් මාගර් එකතු කර නොගැනීම පිළිබඳව සාකච්ඡා කර නව ක්‍රියාමාගර් ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී පී.ලෝගනාදන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/2/4.** දැනට රටේ බරපතල ආථර්ික අබර්ුදයක් නිමර්ාණය වී පෝලිම් යුගයක් නිමර්ාණය වී ඇති අතර, ඒ සඳහා ප්‍රදේශයේ ජනතාවට සහන සැපයීමට ලුණුගල ප්‍රාදේශිය සභා සභික සභිකයින්ගේ වගකීම වන අතර, අපට කල හැකි කැපකිරීම සහ ආදශර්ය පිළිබඳව සාකච්ඡා කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ආර්.ඩබ්.ඩබ්.ඇඞ්වින් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/2/5.** 2022 මාගේ ප්‍රතිපාදන වලින් ලුණුගල ජෙම් ස්ටාර් ක්‍රිඩා සමාජය, වික්ටරි ක්‍රිඩා සමාජය, සුමුදු ක්‍රීඩා සාමජය සඳහා පහත සඳහන් ක්‍රීඩා උපකරණ ලබාදීමට යෝජනා කරමි.

- ජෙම් ස්ටාර් ක්‍රිඩා සමාජය :- ටේබල් ටෙනිස් මේසය හා උපකරණ - රු.100000.00
- සුමුදු ක්‍රිඩා සමාජය :- අත්පන්දු, පාපන්දු, ක්‍රිකට් බැට් - රු.50000.00
- වික්ටරි ක්‍රීඩා සමාජය :- අත්පන්දු, පාපන්දු, ක්‍රිකට් බැට් - රු.50000.00

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/2/6.** A5 පස්සර/ලුණුගල මාගර් කොටස සංවධර්නයේදී මනා සහයෝගයක් ලබාදුන් 23 කණුව සමෘද්ධිලාභී පට්ටිය ගෙදර විමල් කුමාර මහතා සහ එම පවුලට ප්‍රදේශයේ ජල අවශ්‍යතාවයට බවුසර් වලට

ජලය පුරවා ගැනීමට අවශ්‍ය පහසුකම් සහ දැඩි අබර්දයක්ව පවතින විදුලි අබර්දයට තමන් විසින්ම නිමර්ාණය කරන ලද ජල විදුලි බලාගාරයක් තම නිවසට සහ අසල ඇති බුදු පිළිමයට විදුලිය ලබාදීම වෙනුවෙන් ප්‍රණාමය පුද කිරීමටත් ඔහුට අවශ්‍ය සහය ලබාදීමටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී පි.ලෝගනාදන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/2/7.** ලුණුගල ජුම්මා පල්ලිය ඉහල මහල බිත්ති බැඳීම සඳහා වන ඇස්තමේන්තුව නව සිමෙන්ති මිලට සමාන වන පරිදි සකස් කර ඇති අතර, එම මුදල රු.589816.20 කි. එම මුදලට අදාළ කමර්ාන්තය සිදුකිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/2/8.** යපම්ම විහාරස්ථානයේ දහම් පාසල් ගොඩනැගිල්ල ඉදි කිරිම සඳහා ජේ.සි.බි.යන්ත්‍රය පැය 03 ක කාලයක් වෙනුවෙන් ලබා දීමට සුදුසු බවට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පි.අනුර වික්‍රමතුංග මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/3. ගරු මන්ත්‍රී ආර්.එම්.සිරියාවති මැතිනියගේ යෝජනා**

**05/3/1.** පීස්සගම, පල්ලේකිරුව හා වේරගොඩ ග්‍රාම නිලධාරි වසම් තුනෙහි ගොවි සංවිධාන තුන යටතේ සාමාජික ගොවීන් සඳහා කිඹුලා වගර්යේ උදලු තල රු.300000.00 කට යටත්ව ලබාදීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්.අසංක විජේබණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/4. ගරු මන්ත්‍රී එම්.ගනේෂමූතරී මැතිතුමාගේ යෝජනා**

**05/4/1.**මැටිගහතැන්න රෝහලේ වෛද්‍ය නිලධාරිගේ නිවසට පිවිසෙන මාගර්ය ජේ.සී.බී.යන්ත්‍රය යොදා සකස් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී පි.සුබ්‍රමනියම් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/4/2.**මඩොල්සිම නගරය ආසන්න වතු වල ප්‍රධාන මාගර්යේ ඇති කසල එකතු කිරීමට යෝජනා කරමි. එම කසල එකතු කිරීමට වතු පරිපාලනයෙන් 2022 වෂර්යේ අයවැයේ ඉදිරිපත් කරන ලද මුදල අයකිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/4/3.**මඩොල්සිම සකස් කර ඇති පුස්තකාලය විවෘත කිරීමේ උත්සවය පවත්වා ජනතාවගේ ප්‍රයෝජනයට ලබා දීමට අවශ්‍ය කටයුතු කරන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/4/4.**මඩොල්සිම උවකැලේ වත්තේ කෝවිල් මාගර්ය පිළිසකර කිරීමට ජේ.සී.බී.යන්ත්‍රය ලබාගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩි.එම්.තිලකසිරි දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/5. ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමාගේ යෝජනා**

**05/5/1.**ඇකිරිය නව ගම්මානයේ ජල ව්‍යාපෘතිය සඳහා ජල නල 100 - 150 ක් ලබා ගැනිම සඳහා 20% අත්තිකාරම් මුදලක් ග්‍රාම සංවධර්න සමිතිය වෙත ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/5/2.**ඇකිරිය පහල යාය නව ගම්මානයට පිවිසෙන මාගර්යේ කොටසක් ඉදි කිරිම කමර්ාන්තයේ රැඳවුම් මුදල නිදහස් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ආර්.ඩබ්.ඩබ්.ඇඩ්වින් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/5/3.**ඇකිරිය සෙව්වන්දි පෙර පාසලේ දූවා දරුවන් වෙනුවෙන් සහතික පත්‍ර 25 ක් මුද්‍රණය කොට ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පී.අනුර වික්‍රමතුංග මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

## 06. කාරක සභා වල වාතර්ා ඉදිරිපත් කිරිම.

### 06/1. මුදල් කමිටු වාතර්ාව

2022.03.08 දින පැවති මුදල් කමිටු වල නිදෙර්ශ කමිටු ගරු සභාපති සී.ජගත් චන්ද්‍ර දළුකොටුව මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

**2022.03.08 වන දින පැවති මුදල් කමිටු වල නිදෙර්ශ සංශෝධන කිසිවක් නොවූ හෙයින් සභා සම්මත විය යුතු යැයි ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා විසින් යෝජනා කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව එම නිදෙර්ශ සභා සම්මත විය.**

### 06/2. නිවාස හා ප්‍රජා සංවධර්න කමිටු වාතර්ාව

2022.03.16 දින පැවති නිවාස හා ප්‍රජා සංවධර්න කමිටුවේ නිදෙර්ශ කමිටු ගරු සභාපති ඩී.සෙල්වරාණි මැතිනිය විසින් ඉදිරිපත් කරන ලදී.

### 06/2/1. සංශෝධන

**ගරු මන්ත්‍රී ඩී.එම්.අසංක විජේබණ්ඩාර මැතිතුමා.**

කොවිඩ් වසංගත කාලයෙන් පසු පල්ලේකිරුව සතිපොල මේ වන තෙක් ක්‍රියාත්මක වන්නේ නැත.

**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

ප්‍රදේශයේ ගොවි මහතුන් එක්වී එම සතිපොල නැවත ආරම්භ කිරිමට කටයුතු කළ යුතුයි.

**ගරු මන්ත්‍රී එම්.ගනේෂමූතරී මැතිතුමා**

මඩොල්සිම ත්‍රි රෝද රථ ගාලෙන් සභාවට ආදායමක් ලැබෙනවාද?

**ගරු මන්ත්‍රී ආර්.ජෙයශංකර් මැතිතුමා**

මේ වන විට ත්‍රි රෝද රථ 40 ක් පමණ ලියාපදිංචි වී තිබෙන නමුත් ත්‍රි රෝද රථ 80 ක් පමණ නගරය තුල ධාවනයේ යෙදෙනවා. ඒ සියල්ල ලියාපදිංචි කොට සභාවට ආදායමක් ලබා ගත යුතුය. එසේම මේ සම්බන්ධව රැස්වීමක් පවත්වන්නේ නම් ත්‍රි රෝද රථ සංගමයේ සභාපතිතුමා අනිවාර්යෙන් සහභාගි විය යුතු බවට දැනුම් දිය යුතුය. එසේම එම සංගමය සභාවේ පාලනයට කඩිනමින් ලබා ගත යුතුය.

**2022.03.16 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවධර්න කමිටු වල නිදෙර්ශ ඉහත සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය යුතු යැයි ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා විසින් යෝජනා කරන ලදි. එම යෝජනා ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව එම නිදෙර්ශ සභා සම්මත විය.**

### 06/3. පරිසර හා පහසුකම් කමිටු වාතර්ාව - නැත

### 06/4. කාමරීක සේවා කමිටුව

2022.03.04 වන දින පැවති කාමරීක කමිටු වාතර්ාව කමිටුවේ සභාපති එම්.බී.සමන්කුමාර මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

### 06/4/1. සංශෝධන

**ගරු මන්ත්‍රී ඩී.එම්.තිලකසිරි දිසානායක මැතිතුමා.**

කමර්ාන්ත කමිටු වාතර්ාවේ 06 වැනි කරුණට අදාළව සභා අරමුදලින් ලක්ෂ 02 ක් වැය කිරිම සම්බන්ධව පැහැදිලි කරන්න.

**ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා.**

කමර්ාන්ත කමිටු සභාපති ගරු මන්ත්‍රී එම්.බී.සමන් කුමාර මැතිතුමා හට කමර්ාන්ත සම්බන්ධ දැනුමක් පවතින බව මා දරණ මතයකි. එසේම සිල්ක්ෆාම් මාගර්ය නිරීක්ෂණය කිරිමට යාමේදී මා හට එතුමා විසින් දුරකතන ඇමතුම් 3,4 ක් ලබා ගෙන තිබුනා. එසේම එම ඉදි කිරිම සම්බන්ධව අදහස් ප්‍රකාශ කිරිමේදී එම මාගර්යේ දිග ප්‍රමාණය සහා අරමුදලින් අඩි 10 ක් හා ප්‍රාදේශිය ලේකම් කායර්ාලයෙන් අඩි 20 ක් ලෙස ඉදි කිරිම සදහා මුදල් ප්‍රතිපාදන වෙන් කොට තිබුනා. මෙම කමර්ාන්තය විමශර්ණය කළ හොත් මගේ මන්ත්‍රී ධූරය අහිමි වන්නේ නැහැ. නමුත් කාමරීක නිළධාරින් දෙදෙනෙකුගේ රැකියාවයි අහිමි වන්නේ

මාගර්යේ දිග ප්‍රමාණය පිළිබඳව යම් කිසි ගැටළුවක් ඇතිවුයේ නම් වැඩ පරිපාලක මහතාට හෝ කාමරීක නිළධාරි මහතාට මිනුම් පටියක් මගින් දිග මැනිය යුතුය තිබුනි. එසේම ආයතනයේ ඇති ලිපිගොනුව පරික්ෂා කළ යුතුව තිබුනි. එසේම පාස්රෝස් මාගර්යේ ඉදි කිරිම් සම්බන්ධවත් අදහස් දැක්වීමට අවශායි. එම කමර්ාන්තයට අදාළ ඇස්තමේන්තුව මා දුටුවා. එහිදි එක් අවස්ථාවක ප්‍රාදේශිය සභාවෙන් එක් ලක්ෂ තිස්දහසක පමණ පස් කැපුවා. දෙවැනි වතාවේ තුන් ලක්ෂ ගණනක එම මාගර්යේ ගල් ඉවත් කරනු ලැබුවා.නමුත් ඇස්තමේන්තු 02 හිම පැවතියේ එකම වැඩ විස්තරය.

ගරු මන්ත්‍රි එම්.බි.සමන් කුමාර මැතිතුමා දන්නවා ගම්පෙරළිය වැඩසටහන යටතේ ගරු මන්ත්‍රි චමින්ද විජේසිරි මැතිතුමාගේ ප්‍රතිපාදන යටතේ මාගර් ඉදි කිරිම් කටයුතු වලදී ප්‍රධාන මාගර්ය දක්වා වෙඩි බෙහෙත් දමා කළු ගල් ඉවත් කරනු ලැබුවා.එසේම ඔබතුමාට බලන්න පුළුවන් තවත් විශාල කලු ගල් ඉතිරිව පවතිනවා.ඒවාටත් මගේ අතින් වියදම් කරමින් අඩි 05 ක් පමණ ගැඹුරට බෝර දමලා තියෙනවා.එසේම කළු ගල් විදින්න භාවිතා කරන උපකරණ පස්සරින් හෝ බදුල්ලෙන් රැගෙන ආ යුතුයි. කුමන පුද්ගලයෙක් කුමන කමර්ාන්තයක් කලද එයින් ජනතාවට සේවයක් සිදු විය යුතුයි යන්න මා දරණ මතයකි.

තවද එල ඇති රුකට ගල් ගසති යන මතය මා විශ්වාස කරන කරුණකි. මම ජනතාවට සේවයක් ඉටු කර ඇති අයෙක් බවට ආත්ම තෘප්තියක් පවතිනවා. එසේම නාම පුවරුවක් සවි කිරිම සම්බන්ධව යම් කිසි අයෙක්ට ගැටළුවක් පවතිනවා නම් ප්‍රාදේශිය සභාවේ ඇස්තමේන්තු කරලා ප්‍රතිපාදන වෙන් කර නාම පුවරුවක් සවි කළ යුතුයි. එසේම මෙම කමර්ාන්තය පිළිබඳව ඕනෑම විගණනයකට මුහුණ දීමට මා සුදානම්.

මමත් මනුෂායක්.මගෙත් වැරදි අඩුපාඩු තිබිය හැකියි. දැනට වසර 20ට අධික කාලයක් මා දේශපාලනයේ නියැලෙන අතර ප්‍රාදේශිය සභාවේ මුදල් වංචාකරලා හෝ ගසාකාලා නැහැ. ඒ සඳහා අනුබල දීම් හෝ සිදු කර නැහැ.තව බොහෝ දේ පැවසිය යුතු නමුත් ඒ සඳහා අවස්ථාව ලද විගස ඒ සියල්ල පැවසීමටත් නොපැකිලෙන බවත් ප්‍රකාශ කරමි.

එසේම මෙම කමර්ාන්තය ආරම්භ කිරිමට පෙර හිටපු සභා ලේකම් කැළුම් සංජීව මහතාගේ හා ගරු සභාපතිතුමාගේ නිරික්ෂණයද සිදු විය.එසේම මෙවැනි අවස්ථාවකට මුහුණ දීමට සිදු වීම පිළිබඳව මා දැඩි ලෙස අප්‍රසාදය පළ කරනු ලබනවා.

<u>**ගරු මන්ත්‍රි එම්.බි.සමන් කුමාර මැතිතුමා.**</u>

කමර්ාන්ත කමිටු සභාපති වශයෙන් අදහස් ප්‍රකාශ කරන්න කැමතියි. මා ප්‍රාදේශිය සභා මන්ත්‍රිවරයෙකු වු පසු කොන්ත්‍රාත් කිරිම නවතා තිබෙනවා. මන්ද දේශපාලනය හා ව්‍යාපාර කටයුතු සමබර කර ගැනීම ගැටළුවක් වන බැවිනි. එසේම පාස්රෝස් මාගර්යේ ඉදි කිරිම් කටයුතු ගරු ඌව පළාත් හිටපු ප්‍රධාන අමාත්‍ය චාමර සම්පත් දසනායක මැතිතුමන්ගේ ප්‍රතිපාදන මත සිදු වුවකි. එහිදි යම් අකටයුත්තක් සිදු වුයේ නම් ඒ පිළිබඳව විමශර්නය කරන ලෙසත් ඉල්ලා සිටිනවා. එසේම සිල්ක්ෆාම් මාගර්ය සම්බන්ධව ලබා දුන් කමර්ාන්ත කමිටු නිරික්ෂණ වාතර්ාවේ කිසිදු ස්ථානයක එම කමර්ාන්තය සිදු නොකල බව සඳහන් වී නැත.

එහි අථර්ය පිළිබඳව නැවතත් අවධානය යොමු කරන ලෙස දන්වා සිටිනවා. එහි ව්‍යාකුල තත්ත්වයක් පවතින බවයි සඳහන් කොට ඇත්තේ. තවද මිනුම් පටියක් මගින් මැනුම් කටයුතු සිදු කිරිමට මා කාමරීක නිළධාරියෙකු නොවන බවත් කමිටු සභාපති ලෙස එම කමර්ාන්තයේ ප්‍රමිතිය තහවුරු කිරිමට පියවර ගන්නා ලෙසයි දක්වා ඇත්තේ. එසේම මා හට නිරික්ෂණය වුයේ වෙන් කර ඇති මුදලින් එම කමර්ාන්තය නිම කිරිමට නොහැකි නිසා තාක්ෂණ නිළධාරි අධික්ෂණය ලබා ගන්නා ලෙසයි. මෙහිදි මා විසින් ගරු මන්ත්‍රි එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා විවේචනය කොට නැති අතර එතුමා වැරදි වැටහීමක පසුවන බව හැඟි යනවා. එසේම ගරු අමාත්‍ය වඩිවේල් සුරේෂ් මැතිතුමා නමින් සවි කර ඇති නාම පුවරුවක් සහිත ඉදි කිරිමක් වෙනුවෙන් රැඳවුම් මුදල් නිදහස් කිරිම ගැටළු සහගතය.

තවද මා විසින් කොන්ත්‍රාත් සිදු නොකරන නිසාත් කමර්ාන්ත කමිටු සභාපති ලෙසත් වගකීමෙන් යුතුව කමර්ාන්ත පිළිබඳව අධික්ෂණය කරන බවත් දන්වා සිටිනු කැමැත්තෙමි.

පරිසර කමිටුවේ කටයුතු කරන අවස්ථාවන්හිදි ද මා විසින් නිදෙර්ශ කිහිපයක් ලබා දුන් අතර ඒවා ක්‍රියාත්මක වුයේ නැත. කමර්ාන්ත කමිටු සභාපති ධුරයේ කටයුතු කිරිම ගැටළු සහගත වන්නේ නම් එයින් ඉල්ලා අස්වීමට මා සුදානම් බවත් ප්‍රකාශ කරමි.

<u>**ගරු සභාපති සි.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**</u>

වගකීමෙන් යුතුව කමර්ාන්ත කමිටුව පවත්වාගෙන යාම වැදගත්.එහිදි යම් ගැටළුවක් මතු වුයේ නම් ඊට මැදිහත් වීමට ද මා සුදානම්.

**2022.03.04 යන දින පැවති කාමරීක කමිටුවේ නිදෙර්ශ ඉහත සංශෝධන වලට යටත්ව සභා සම්මත විය යුතු යැයි ගරු මන්ත්‍රි ඩි.එම්.අසංක විජේබණ්ඩාර මැතිතුමා විසින් යෝජනා කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රි එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව එම නිදෙර්ශ සභා සම්මත විය.**

**07. ලැබීම් හා ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශ /එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාතර්‍ා සහ ප්‍රාදේශිය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සළකා බැලීම.**

**07/1. සංශෝධන**

**ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා.**

ගිය මසට සාපේක්ෂව මෙම මස ගමන් වියදම් ශිෂර්ය ප්‍රමාණාත්මකව ඉහල යාමක් දක්නට ලැබෙනවා. එසේ වීමට හේතු දැක්වීම අවශ්‍ය වේ.එසේම ණය හිමියන් අඩු අගයක පැවතීම සතුටුදායක තත්ත්වයකි. එසේම මෙම වාතර්‍ාව සාරාංශ වාතර්‍ාවක් ලෙස නොව එක් එක් ශිෂර්යන් පැහැදිලි කරමින් සවිස්තර වාතර්‍ාවක් සභා වාතර්‍ාව සමඟ ලැබෙන්නට සළස්වන ලෙස ඉල්ලා සිටිමි.

**2022 පෙබරවාරි මස ලැබීම්, ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශ හා එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාතර්‍ාව සංශෝධන වලට යටත්ව සත්‍ය වාතර්‍ාවක් බව සහා සම්මත විය යුතු යැය ගරු මන්ත්‍රී ආර්.ඩබ්.ඩබ්.එඩ්වින් මැතිතුමා විසින් යෝජනා කළ අතර, ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා එම යෝජනාව ස්ථිර කිරීමෙන් අනතුරුව එම වාතර්‍ාව සහා සම්මත විය.**

**08. වෙනත් කරුණු**

**ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා.**

මාතර්‍ු 08 වන දින ලෝක කාන්තා දිනය යෙදී ඇති පසුබිමක අප සභාව ද කාන්තා නියෝජනයන් පවතින බවත් ගරු උපසභාපතිතුමිය ඇතුළු මන්ත්‍රිතුමියන්ලා සහ සභා ලේකම් තුමිය හට තව දුරටත් ජනතාවට සේවාවක් සිදු කිරිමට ශක්තිය ලැබේවායි ප්‍රථර්නා කරමි.

**ගරු මන්ත්‍රී එම්.බි.සමන් කුමාර මැතිතුමා.**

පරිසරයට ආදරය කරන මිනිසුන් වශයෙන් අප සභා වාරයට අද දින රැගෙන විත් ඇති ජල බෝතල් වල හිස් බෝතල් නැවතත් එක් බෝතලයක් වෙනුවෙන් රු.10.00 ක මුදලක් ගෙවා භාර ගනු ලබන එකම ආයතනය සතොස ආයතනය පමණයි. එය අගය කළ යුතු කාරණාවකි.

එසේම මාගේ මව් පාසල වනුයේ ලුණුගල ජාතික පාසලයි. ඉතිහාසයේ මේ වන තෙක් සෑම වසරකදීම විශිෂ්ඨ ප්‍රතිඵල පෙන්වූ විද්‍යාලයක් වශයෙන් අප විද්‍යාලය නම් දරා තිබෙන අතර මේ වසරේ 05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයෙන් එක් දරුවෙකු හෝ සමත් නොවීම පිළිබඳව දැඩි ලෙස කණගාටුවට පත් වෙමි. මිට වඩා දුෂ්කර පාසල් වල දූ දරුවන් සමත් වීමත් අප විද්‍යාලයේ එක් දරුවෙකු හෝ සමත් නොවීමත් ගැටළුකාරි තත්ත්වයකි.

එහිදි පරිපාලනමය ගැටළුවක් හෝ ගුරු භවතුන්ගේ ගැටළුවක් ද යන්න කඩිනමින් පරික්ෂණයක් පැවැත්විය යුතුයි. ඒ පිළිබඳව ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත දන්වා සිටින ලෙසත් ඉල්ලා සිටින අතර නැවතත් ඒ පිළිබඳව දැඩි අප්‍රසාදය පල කර සිටිනවා.

**ගරු සභාපති සි.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

දැනට වසර 04 ක පමණ කාලයක සිට සෑම වසරකදීම සිංහල හා දමිළ මාධ්‍ය 02 න් ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ 02 බැගින් පවත්වා තිබෙනවා. නමුත් ඒ සම්බන්ධව කිසිදු ප්‍රසංශාවක් හෝ එම විද්‍යාලයෙන් අප වෙත ලබා දී නොමැති බව කණගාටුවෙන් යුතුව ප්‍රකාශ කරමි.

**ගරු මන්ත්‍රී ආර්.කණගසුන්දරි මැතිනිය.**

ගරු උප සභාපතිතුමිය වෙත යොමු කළ පසුගිය සභා වාතර්‍ාව මාගේ නිවසට ලැබි තිබුනා. එබැවින් ලිපි යොමු කිරිමේදී සැළකිලිමත් වන ලෙස ඉල්ලමි.

**ගරු මන්ත්‍රී ආර්.එම්.සිරියාවති මැතිනිය.**

ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා කාන්තාවන් පිළිබඳව අදහස් දැක්වීම පිළිබඳව සතුටට පත්වෙමි. වසර කිහිපයක්ම පිස්ස දිය ඇල්ල පිළිබඳව යෝජනා සභාවට ඉදිරිපත් කලද ඒවා ක්‍රියාත්මක නොවූ පසුබිමක ගරු මන්ත්‍රී එම්.බි.සමන් කුමාර මැතිතුමා විසින් එම ස්ථානය සංවධර්නය කිරිමට පියවර ගැනීම පිළිබඳව සතුටට පත් වෙමි. තවද එම ස්ථානයේ අශෝභන ලෙස හැසිරිම වළක්වාලමින් කටයුතු කරන ලෙසත් ඒ පිළිබඳව දන්වමින් නාම පුවරු සවිකරන ලෙසත් ඉල්ලා සිටිමි.

**ගරු මන්ත්‍රී එම්.බි.සමන් කුමාර මැතිතුමා.**

ඒ පිළිබඳව ඌව පළාත් සංචාරක අමාත්‍යාංශයට ස්තුතිය පිරිනමන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා.**

හිටපු සභා ලේකම් ඩබ්.ඒ.කැළුම් සංජීව මහතා වෙත මාගේ විශේෂ ස්තුතිය පිරිනමමි. මන්ද එතුමා හදිසියේම එම තනතුරේ වැඩ භාර ගෙන පරිපාලන කටයුතු ඉතා කායර්ක්ෂමව හා වගකීමෙන් යුතුව කටයුතු කරනු ලැබුවා. එසේම වත්මන් සභා ලේකම්තුමියටද සාථර්ක පරිපාලනයක් සිදු කිරිමට ශක්තිය ලැබේවායි

ප්‍රාථර්නා එක් කරමි. එසේම සභාවට යොමු කරන ගිණුම් වාතර්ා සවිස්තරව  ලබා දීමට ඔබතුමියගේ අවධානය යොමු වනු ඇතැයි අපේක්ෂා කරමි.

**න්‍යාය පත්‍රය අනුව අද දින සභා රැස්වීමේ කටයුතු අවසන් කරන ලදි.**
**මීලග මහ සභා රැස්වීම 2022.04.26 වන දින පෙ.ව.10.00 ට පවත්වන බව දැනුම් දුනි.**

(සී.ජගත්චන්ද්‍ර දලුකොටුව),
සභාපති,
ප්‍රාදේශිය සභාව,
ලුණුගල